## විරෝධය දැක්වීම

පහත සඳහන් වෙළෙඳ ලකුණු ලියාපදිංචි කිරීම පිළිබඳව විරුද්ධවීමට හේතු ඇති කවරකු විසින් හෝ මේ ගැසට් පත්‍රය පළ වන දින සිට දෙමසක් ඇතුළත දී රුපියල් 25 ක අවලංගු නො කරන ලද හෝ ලාංඡිත මුද්දරයක්ද සමග ටී.ඇම්. 7 දරන පෝරමය මගින් විරෝධතා දැන්වීම ඉදිරිපත් කරන ලෙස මෙයින් දන්වා සිටිනු ලැබේ. රෙජිස්ට්‍රාර් විසින් සුදුසුයැයි සලකනු ලබතොත්, විරෝධතා දැන්වීම ඉදිරිපත් කිරීමේ කාලසීමාව ඔහු විසින් නියම කරනු ලබන කොන්දේසි උඩ දීර්ඝ කරනු ලැබිය හැකිය.

ලියාපදිංචි කිරීම ඉල්ලුම් කර සිටින තැනැත්තාට තම ඉල්ලීම අස්කර ගන්නට අවස්ථාවක් සැලසෙනු පිණිස, විරෝධතා දැන්වීම පිළියෙල කිරීමේ වියදම් දැරීමට පෙර සෑහෙන ප්‍රමාණ කාලයක් දී ලියවිල්ලකින් දැන්වීමක් එකී ඉල්ලුම්කරු වෙත යවා මිස විධිමත් විරෝධතාවක් ඉදිරිපත් නො කළ හැකිය.

විරෝධතාවක් සම්බන්ධයෙන් ඉල්ලුම්කරු විසින් එරෙහිව කරුණු ඉදිරිපත් නො කළහොත් එසේ විරුද්ධ වන්නකු විසින් ගාස්තු අයකර ගැනීමේ නියෝගයක් සඳහා කරනු ලබන ඉල්ලීමක් ගැන සළකා බැලීමේදී යට කී පරිදි දැන්වීමක් යැවීමේ කාර්යය පැහැර හැර තිබීම ද සැළකිල්ලට ගනු ලැබේ.

---

## පේටන්ට් බලපත්‍ර ආඥාපනත යටතේ නිවේදන

### දැන්වීමයි

පහත දැක්වෙන විශේෂ විස්තරය පිළිගෙන තිබේ :—

වර්ෂ 1964 ක් වූ මාර්තු මස 13 වන දින දරණ 5399 වන අංකය.

CELANESE CORPORATION OF AMERICA.

" පිල්ටර "

**සංක්ෂේප සටහන.**—මෙම නිර්මාණයේ ස්වභාවය, පහත දැක්වෙන 1 වන අයිතිය ප්‍රකාශ කිරීමෙන් නිශ්චය කර ගත හැක :—

1. සිගරට් දුම් පිල්ටර පේනුවක්. මෙය, පේනුව දිගට ම ඇදී යන, සැලකිය යුතු තරමට ඒකාකාර ව රැළි වැටුණු, අඛණ්ඩ සූත්‍රිකා වලින් යුක්ත වෙයි. මෙහි එක් එක් සූත්‍රිකාවේ රැළි, යාබද සූත්‍රිකා වල රැළි සමග කිසි සේත් හෝ බොහෝ දුරට ම වාගේ හෝ සම්පාත නොවන පරිදි සකසා තිබේ. මෙම සූත්‍රිකා මිටිය, කඩදාසි නළයක් තුළ අන්තර්ගත ව ඇත. එම මිටියෙහි අන්තර් සූත්‍රික සමහන්වීමක් නොතිබීම ද කඩදාසි නළය නිසා ඇති වන වැළකුමෙන් නිදහස් වූ විට මිටියේ විෂ්කම්භය යටත් පිරිසෙයින් 20% කින් වත් වැඩි වීම ද මෙහි විශේෂ ලක්ෂණ වෙයි.

අයිතිය ප්‍රකාශ කිරීම් 9 ක් ද නිදසුන් 4 ක් ද රූ සටහන් පත් 2 ක් ද වෙයි.

එස්. එල්. ද සිල්වා,
පේටන්ට් බලපත්‍ර රෙජිස්ට්‍රාර්.

වර්ෂ 1965 ක් වූ අගෝස්තු මස 30 වන දින,
කොළඹ දී ය.

2-943/1

---

### දැන්වීමයි

පහත දැක්වෙන විශේෂ විස්තරය පිළිගෙන තිබේ :—

වර්ෂ 1964 ක් වූ මාර්තු මස 24 වන දින දරණ 5400 වන අංකය.

PIERREL S. P. A.

" ඔක්සිටෙට්‍රාසයික්ලීන් අධික ප්‍රමාණ ලබා ගැනීම සඳහා අලුත් ක්‍රම."

**සංක්ෂේප සටහන.**—මෙම නිර්මාණයේ ස්වභාවය, පහත දැක්වෙන 1 වන අයිතිය ප්‍රකාශ කිරීමෙන් නිශ්චය කර ගත හැක :—

1. ඔක්සිටෙට්‍රාසයික්ලීන් නිපදවීම සහ නැවත ලබා ගැනීම සඳහා ක්‍රියා වලියක් Streptomyces Capuensis nov. spec. C. B. S. 113.63 නැමැති මාදිලිය ද එහි විකෘත ද භාවිත කිරීම මෙහි විශේෂ ලක්ෂණයක් වෙයි. මුනාසේ පැහැදිලි තත්ත්ව යටතේ දී පැසුණු පෙනෙන් මිලි ලීටරයකට ඔක්සිටෙට්‍රාසයික්ලීන් මයික්‍රෝ-ග්‍රෑම් 12,000 තෙක් ඇති කර වීම මෙම ද්‍රව්‍යයේ විශේෂ ගුණයක් වෙයි.

අයිතිය ප්‍රකාශ කිරීම් 6 ක් ද නිදසුන් 2 ක් ද වේ.

එස්. එල්. ද සිල්වා,
පේටන්ට් බලපත්‍ර රෙජිස්ට්‍රාර්.

වර්ෂ 1965 ක් වූ අගෝස්තු මස 30 වන දින,
කොළඹ දී ය.

2-943/2

---

### දැන්වීමයි

පහත දැක්වෙන විශේෂ විස්තරය පිළිගෙන තිබේ :—

වර්ෂ 1964 ක් වූ මාර්තු මස 25 වන දින දරණ 5401 වන අංකය.

WALCHANDNAGAR INDUSTRIES LIMITED AND JYOTI PRASAD MUKHERJI.

" සල්පර් දාහක පිළිබඳ වැඩි දියුණු කිරීම් හෝ ඒ පිළිබඳ වූ."

**සංක්ෂේප සටහන.**—මෙම නිර්මාණයේ ස්වභාවය, පහත දැක්වෙන 1 වන අයිතිය ප්‍රකාශ කිරීමෙන් නිශ්චය කර ගත හැක :—

1. සල්පර් දාහකයක්. මෙහි ඇතුළත් කොටස් නම්, ද්‍රව වූ සල්පර් කඩින් තක් මත් තෙහි සර්පර්වල දහනය සිදු වන දහන කුටීරයක් ද, මෙකී දහන කුටීරයට ඉහලින් පිහිටි වායු කුටීරයක් ද, ඉහත සඳහන් ද්‍රව සල්පර් කඩින්තේ මට්ටම අවශ්‍ය ඕනෑ ම පිළිවෙළකට වෙනස් කර ගත හැකි උපක්‍රමයක් ද, ඉහත සඳහන් ද්‍රව්‍ය සල්පර් කඩින්තේ වාෂ්පී කරන කලාපයේ තැන්පත් කර ඇති කේතු දෙණිකාවක් ද වෙයි. අවස්ථා දෙකක දී දහන කුටීරය තුළට වාතය සපයන ප්‍රාථමික පයිප්පයක් ද, ද්විතීයික පයිප්පයක් ද, දෙණිකාවේ තිබීම මෙහි විශෙෂ ලක්ෂණයක් වෙයි. මෙකී ප්‍රාථමික වාත නළය දහන කුටීරයට වාතය සපයනුයේ කේතු දහන දෙණිකාව පිහිටි මට්ටමේ දී ය. ද්විතීයික වාත නළය වාතය සපයනුයේ දැවෙන සල්පර් දැල්ල පිහිටි කලාපයේ දී ය.

අයිතිය ප්‍රකාශ කිරීම් 7 ක් ද රූ සටහන් පත් 1 ක් ද වේ.

එස්. එල්. ද සිල්වා,
පේටන්ට් බලපත්‍ර රෙජිස්ට්‍රාර්.

වර්ෂ 1965 ක් වූ අගෝස්තු මස 30 වන දින,
කොළඹ දී ය.

2-943/3

---

### දැන්වීමයි

පහත දැක්වෙන විශේෂ විස්තරය පිළිගෙන තිබේ :—

වර්ෂ 1964 ක් වූ මාර්තු මස 25 වන දින දරණ 5402 වන අංකය.

WALCHANDNAGAR INDUSTRIES LIMITED AND JYOTI PRASAD MUKHERJI

" ද්‍රාව ඇඳුම්."

**සංක්ෂේප සටහන.**—මෙම නිර්මාණයේ ස්වභාවය, පහත දැක්වෙන 1 වන අයිතිය ප්‍රකාශ කිරීමෙන් නිශ්චය කර ගත හැක :—

1. ද්‍රාව ඇඳුමක්. මෙහි වූ එළවුම් අංගවල සහ එළවෙන අංගවල ප්‍රතිවිරුද්ධ මූණත්, ගෝලාකාර තලවලින් සමන්විත වන පරිදිත්, මේ තලවල කේන්ද්‍ර දෙලිකාවේ කේන්ද්‍රය හා සෑහෙන තරමකට සම්පාත වන පරිදිත්, ඒවා සලසා ඇත. මේ නයින්, ඉහත කී අංග අතර පරතරය එක්කෝ නියත ව නැතිනම් දෙලිකාව පිහිටන හැම පිළිවෙළක් ම සම්බන්ධයෙන් පූර්ව-නිශ්චිත සීමා ඇතුළත පවත්වා ගනු ලැබේ.

අයිතිය ප්‍රකාශ කිරීම් 3 ක් ද රූ සටහන් පත් 4 ක් ද වේ.

එස්. එල්. ද සිල්වා,
පේටන්ට් බලපත්‍ර රෙජිස්ට්‍රාර්.

වර්ෂ 1965 ක් වූ අගෝස්තු මස 30 වන දින,
කොළඹ දී ය.

2-943/4

